# ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

## කාර්ය මණ්ඩල ඇබෑර්තු

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය, ජාතික ව්‍යවස්ථාදායක අවශ්‍යතාවයන්ට හා ජාත්‍යන්තර ප්‍රමිතීන් හා නිර්දේශිත පරිචයන් (SARPS) හට අනුකූල වෙමින්, උපායමාර්ගික සැලසුම්කරණය, වෘත්තීය මාර්ගෝපදේශ හා දැඩි ආවේක්ෂණ තුලින්, මනා ලෙස ස්ථාපිත නියාමන කාර්ය රාමුවක් යටතේ ආරක්ෂිත, ප්‍රවේශම් සහගත, කාර්යක්ෂම, ක්‍රමානුකූල හා පරිසර හිතකාමී ජාතික සිවිල් ගුවන්සේවා පද්ධතියක් සහතික කරයි. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය වෙත තම ආයතනයේ පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා ඉහළ සුදුසුකම් හා සිවිල් ගුවන් ක්ෂේත්‍රයේ පැතිරුනු පළපුරුද්ද සහිත, ධෛර්ය සම්පන්න දැඩි උනන්දුවක් සහිත හා ස්වයං උද්යෝගී අයවලුන් අවශ්‍යව ඇත.

### අධ්‍යක්ෂ (ගුවන් තොටුපළ)
### තනතුරු කේතය : HM-1-1-D2 තනතුරු ගණන - 01

**පාරිශ්‍රමික ලැබීම් (වේතනය)** (වැටුප් පරිමාණය (HM1-1) රුපියල් 80,295-15X2,270-114,345 (MS චක්‍රලේඛ අංක 02/2016(I) ප්‍රකාරව)

- සියලූ දීමනා ඇතුළත් මාසික වැටුප දළ වශයෙන් රුපියල් 170,595.00 වන අතර, එයට, මූලික වැටුප, ජීවන අංක දීමනාව, මාසික දීමනාව, අන්තර් දීමනාව හා ප්‍රවාහන දීමනාවද ඇතුළත්ව අදාළ චක්‍රලේඛ ප්‍රකාරව හිමිවේ.
- මසකට ලීටර් 115 ක ඉන්ධන දීමනාව (ඒ වනවිට පවත්නා ඉන්ධන මිල ප්‍රකාරව)
- මේ සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත සාර්ථක අයදුම්කරුවන් හට දළ වශයෙන් රුපියල් 225,000.00 ක විශේෂ තාක්ෂණ දීමනාවක් ගෙවනු ලැබේ.
- වෙනත් ප්‍රතිලාභ - සෞඛ්‍ය රක්ෂණ යෝජනාක්‍රමය, හදිසි අනතුරු රක්ෂණ යෝජනාක්‍රමය, මරණ ප්‍රධාන යෝජනා ක්‍රමය, ප්‍රසාද දීමනා, ලබානොගත් නිවාඩු සඳහා මුදල් ගෙවීම්, ජංගම දුරකථන බිල් ප්‍රතිපූරණය.

**සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්**

**මනාපය - 1**

1. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් භෞතික විද්‍යාව, අභ්‍යවකාශ යානා ඉංජිනේරු තාක්ෂණය, ගුවන් ප්‍රවාහනය, ගගන යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පය හෝ සිවිල් ඉංජිනේරු ශිල්පිය ක්ෂේත්‍රයක වසර තුනකට (03) නොඅඩු කාලයක ප්‍රථම උපාධියක් ලබා තිබීම.

සමග

2. ගුවන්සේවා ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි (මාස්ටර්ස්) සුදුසුකම් හෝ ගුවන්සේවා ක්ෂේත්‍රයට අදාල පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය හෝ සමූහ ජාත්‍යන්තර තලයේ ප්‍රසිද්ධ සංවිධානයක් හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය විසින් පිළිගත් සමාන සංවිධානයක් වෙතින් සය මසකට (06) නොඅඩු කාලයක ගුවන් තොටුපළ සහතිකපත් පාඨමාලාවක් (කළමනාකරණ තලයේ) හදාරා තිබීම.

සහ

3. සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක/ රජයට අයත් සමාගමක හෝ පෞද්ගලික ආයතනයක කළමනාකරණ තලයේ ගුවන් තොටුපළ මෙහෙයුම් ක්ෂේත්‍රයේ අවම වසර දහයක (10) පළපුරුද්ද

**මනාපය - 2**

1. පශ්චාත් උපාධි සුදුසුකම් (ගුවන්සේවා කටයුතු ක්ෂේත්‍රයේ මාස්ටර්ස් සුදුසුකම්) හෝ ගුවන් සේවා කටයුතු වලට අදාළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය හෝ ජාත්‍යන්තරව ප්‍රසිද්ධ සමාන සංවිධානයක් විසින් පවත්වනු ලබන සති හයකට (06) නොඅඩු කාලයක (කළමනාකරණ තලයේ) පාඨමාලා සාර්ථකව සම්පූර්ණ කොට තිබීම හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් පිළිගත් සමාන සුදුසුකම් ලබා තිබීම,

සහ

2. සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක/ රජයට අයත් සමාගමක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක ගුවන්තොටුපළ ක්ෂේත්‍රයේ කළමනාකරණ තලයේ අවම වසර දහතුනක (13) පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**මනාපය - 1**

ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.

**මනාපය - 2**

පහත සඳහන් කරුණු සියල්ල සම්පූර්ණ කොට තිබිය යුතුය :

1. ගුවන්තොටුපල ක්ෂේත්‍රයේ කළමනාකරු වර්ගීකරණයේ (MM1-1) ශ්‍රේණිය 1 තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම,
2. පසුගිය වසර පහක (05) කාලයක තිකැලැල් සේවා වාර්තාවක් පවත්වා ගෙන තිබීම හා දැනට දරන තනතුරෙහි අදාළ සියලු වැටුප් වර්ධක ලබාගෙන තිබීම,
3. අධිකාරිය විසින් අනුමත කළ ගුවන් තොටුපොළ හා ගුවන් තොටුපළ සහතිකකරණය ක්ෂේත්‍රයේ, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ හෝ එහි පිළිගත් ආයතනයක සති හයකට (06) නොඅඩු උසස් අභ්‍යාස පාඨමාලා සාර්ථකව සම්පූර්ණ කොට තිබීම,
4. පසුගිය වසර පහ (05) තුළ වාර්ෂික කාර්යසාධන ඇගැයීම්වලදී 'හොඳයි' හෝ 'ඉහළ' ශ්‍රේණියක් පවත්වා ගෙන තිබීම.

- වයස අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර 55 ට නොවැඩි විය යුතුය. මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්හට හා ශ්‍රී ලංකා ගුවන්හමුදාව, ගුවන්තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ. දේශීය ගුවන්සේවා හෝ පියාසර පාසල් වල අයදුම්කරුවන්හට අදාළ නොවේ.
- වැඩිදුර විස්තර, රැකියාවේ තොරතුරු, විශේෂ තාක්ෂණ දීමනාව සඳහා අවශ්‍යතා සහ **සම්මත අයදුම්පත්‍ර ආකෘතිය**, CAASL ආයතනයේ නිළ වෙබ් අඩවිය වන www.caa.lk වෙතින් බාගත කළ හැක.
- අයදුම්කරුවන් විසින්, තමන් අයදුම් කළ තනතුර/ තනතුරු සඳහා තමන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කිරීම සඳහා අවශ්‍ය ලේඛනවල පිටපත් එවීම අවශ්‍යවේ.
- අදාළ **සම්මත අයදුම්පත් ආකෘති** මගින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් පමණක් භාරගනු ලැබේ. රජයේ සංවිධානවල සේවය කරනු ලබන අයදුම්කරුවන්, තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානී මගින් යොමු කළ යුතුය.
- යථා පරිදි සම්පූර්ණ කළ අයදුම්පත්, ලියාපදිංචි තැපෑලෙන් හෝ ඊමේල් - employment@caa.lk මගින් එවීමෙන් 2023-10-30 දිනට පෙර මෙම කාර්යාලයට ලැබීමට සැලැස්විය යුතුය. අයදුම්පත් ලැබුනු බවට දැනුම් දෙනු ලැබේ.
- අයදුම්පත්, සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්, හා ප්‍රධාන විධායක නිලධාරි, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය, අංක 152/1, මිනුවන්ගොඩ පාර, කටුනායක යන ලිපිනය වෙත යොමුකළ යුතුය. අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.
- සුදුසුකම් නිර්ණායක සපුරාලනු ලබන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ/ විභාග සඳහා කැඳවනු ලැබේ.

**සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරී,**
**ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය,**
**අංක 152/1, මිනුවන්ගොඩ පාර, කටුනායක.**
2023-10-15